
අංක
5
මිල රු. 1.50 යි.
'මාවත' ප්‍රකාශකයෝ,
අශෝක පොත්හල බාරේ,
183, ගාලු පාර,
කොළඹ 4.

# මාවත

ප්‍රගතිශීලී, කලා, සාහිත්‍ය හා සංස්කෘතික ප්‍රකාශනය



'ශ්‍රමය' – එස්. එච්. සරත්ගේ නිර්මාණයකි.

සටහන

## සංස්කෘතික ආක්‍රමණය පරාජය කරමු.

ශ්‍රී ලංකාවට යටත්විජිතවාදය, නව යටත්විජිතවාදය, සමාජ අධිරාජ්‍යවාදය හා ඉන්දියානු ව්‍යාප්තවාදය මගින් එල්ලවී ඇති සංස්කෘතික ආක්‍රමණය හඳුනා ගැනීමට මාවත අංක 3 කතුවැකියෙන් අප උත්සාහ දැරුවා. මාවත අංක 4 සංස්කාරක සටහනින් අපේ මව්බිමේ සංස්කෘතික ක්ෂෙත්‍රය තුළ මෙම ආක්‍රමණ මුල්බැසගෙන ක්‍රියාත්මකවන අයුරු සොයා බැලීමට තැත්කළ අතර සාහිත්‍ය හා අධ්‍යාපන අංශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළා. අප මෙහිදී බලාපොරොත්තුවන්නේ මෙම විනාශකාරී සංස්කෘතික ආක්‍රමණය පරාජය කිරීම ගැන සාකච්ඡා කිරීමයි.

අධිරාජ්‍යවාදීන් මෙරට ආර්ථික, දේශපාලන හා සංස්කෘතික වශයෙන් ආක්‍රමණය කිරීමත් සමගම ඊට විරුද්ධ අරගලයන්ද එම පෙරමුණු තුළින්ම මතුවිය. හැම විදේශීය ආක්‍රමණයක දීම ඊට ගොදුරුවන රටේ පාලක පන්තියෙන් එක්තරා කොටසක් ආක්‍රමණිකයාට පක්ෂපාතවී ගැතිකම් කරන අතර, දේශීය සංස්කෘතිය තම උරුමය කරගත් පොදු ජනතාව ආක්‍රමණිකයා මව්බිමේ පයගැසූ දවසේ සිටම සිය ජාතික උරුමය රැකගැනීමේ අරගලය දියත් කරයි.

### ඉතිහාසය

අපේ වැඩවසම් ඉතිහාස යුගය තුළ ඊට උචිත අංග-සම්පූර්ණ දේශීය සංස්කෘතියක් අපේම සවශක්තියෙන් ගොඩ-නගා තිබුණි. යටත්විජිතවාදී ආක්‍රමණයෙන් එහි සවශක්ති-යටත්, නිර්මාණාත්මක බවටත් බලවත් තර්ජනයක් එල්ලවිය. 19 වන සියවස මුල්භාගයේ විශේෂයෙන්ම 1818 හා 1848

(2 වැනි පිටුවට)

දෙමළ නවකථාව – කේ. එස්. සිවකුමාරන් සහ සුසිල් සිරිවර්දන, සිංහල සිනමාවට අහසින් වැටුණු මිනිස්සු කුමුදු කුසුම් කුමාර, මහගම සේකරගේ 'ප්‍රබුද්ධ' – එච්. ඒ. සෙනෙවිරත්න, කාන්තා විමුක්තිය – සුනිලා

## බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ රංග ශෛලිය

අබේසේකර, යටත්විජිතවාදය පිළිසිඳ ගනියි – ආතර්. පී. වීරසේන, ජාති භේද වාදය එද සහ අද – එස්. ජී. පුංචිහේවා, මංජු ශ්‍රී සහ කුළුකොඳයාවේ හාමුදුරුවෝ ගැන සටහන්, අමරදේව ගැන ප්‍රේමසිරි කේමදාස, රත්න ශ්‍රී විජේසිංහ, පුෂ්පා රම්ලනි රත්නායක, දෙනගම සිරිවර්ධන, සහ අබේවංශ දේවප්‍රියගේ නිර්මාණ

සංස්කාරකවරු: එස්. විජේසූරිය, සිරිල් අභයගුණවර්ධන, සුසිල් සිරිවර්දන, පියල් සෝමරත්න, කුමුදු කුසුම කුමාර – 1978 ජන. - මාර්තු

## සංස්කෘතික ආක්‍රමණය . . . .

මේ අරගලවලදී ඉදිරියෙන්ම ක්‍රියාත්මක වුනේ දේශපාලන පෙරමුණයි. අධ්‍යාපනය, ආගම වැනි මාධ්‍යයන් තුළින් පරගැති චින්තනයක් වැපිරීමට එරෙහිව 19 වන සියවස අග භාගයේ මතුව ඉදිරියට ගිය දේශීය සංස්කෘතික පෙරමුණ 1930 ගණන් වනතුරු අධිරාජ්‍ය විරෝධී අරගලයේ පෙරමුණු බල-ඇණිය වුනා. ආගමික වාද විවාද, පිරිවෙන්, බෞද්ධ අධ්‍යාපනය, අමද්‍යප ව්‍යාපාර, සිංහල පුවත්පත්, සඟරා, නවකතාව, කවිය මෙහි ප්‍රබල සටන් පෙරමුණු ලෙස ක්‍රියාකළා. මිගෙට්ටුවත්තේ ගුණානන්ද, ශ්‍රී සුමංගල, ශ්‍රී ධර්මාරාම, අනගාරික ධර්මපාල, කර්නල් ඕල්කට්, ජෝන් ද සිල්වා, පියදාස සිරිසේන, ආනන්ද රාජකරුණා, වැනි දේශප්‍රේමීන් එහි සෙන්පතියන් වුනා. මීට සමාන්තරව ආරුමුග නාවලර්, පොන්නම්බලම් අරුණාචලම් වැනි දේශප්‍රේමීන්ගේ නායකත්වයෙන් ද්‍රවිඩ ජනතාවද, සිද්දි ලෙබ්බෙ වැනි වියතුන්ගේ මග පෙන්වීම යටතේ මුස්ලිම් ජනතාවද යටත්විජිත ආක්‍රමණයට විරුද්ධ අරගලයේම නිරතවුනා. මේ ජාතික පෙරමුණු තුන සෑහෙන ප්‍රමාණයකින් බෙදී වෙන් වෙන්ව සටන් කිරීමත්, දේශපාලන පෙරමුණෙන් නිවැරදි මගපෙන්වීමක් නොලැබීමත් නිසා අරගලයට ලබාගත හැකි වූයේ සීමිත ජයග්‍රහණයන් පමණයි. මේ භේදවලින් වැඩි වාසි ලැබුණේ යටත්විජිතවාදීන්ටයි.

තවසිය තිස් ගණන්වලදී යළිත් සංස්කෘතික පෙරමුණ පසු බස්වා දේශපාලන පෙරමුණ ඉදිරියෙන් සිටියත් ඒ තුළින් සැබෑ යටත්විජිත විරෝධී ව්‍යාපාරයක් දියත්වුනේ නැහැ. මහින්ද හිමියන් වැනි සැබෑ දේශප්‍රේමීන් නිවැරදිව නැගු රණහඬට යටත්විජිත ගැති දකුණේ පෙරමුණ මෙන්ම දේශීය උරුමය තෝරා බේරා නොගත් වමේ පෙරමුණද ඇහුම්කන් දුන්නේ නැහැ. මේ නිසා සංස්කෘතික පෙරමුණ දේශපාලනයෙන් වෙන්ව විවිධ අරමුණු ඔස්සේ විසිරී ගියා. 1948 දී යටත්විජිතවාදී ආක්‍රමණය ඊටත් වඩා සියුම්වුත්, ගැඹුරුවූත් නව යටත්විජිතවාදී ස්වරූපයක් ගැනීමෙන් තත්වය වඩාත් සංකීර්ණ වන්නට පටන් ගත්තා.

විජිතවාදී ආක්‍රමණයන්ට විරුද්ධ දේශීය විමුක්ති අරගල කෙළින්ම හෝ සැඟවී හෝ නිරන්තර අරගලයක යෙදී සිටියා-මිස, මුළුමණින්ම මියගියේ නැහැ. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1956 දී යළිත් දේශපාලන හා සංස්කෘතික පෙරමුණු පුළුල් පදනමකින් එක්වුනා. මෙහිදීද බහුජාතික එකහත්වයක් ඇති වුනේ නැහැ. එමනිසා ඊට ප්‍රති විරුද්ධව ඉතා බලවත්ව, සියුම්ව හා උපක්‍රමශීලිව ක්‍රියාත්මක වූ විවිධ මාදිලියේ අධිරාජ්‍යවාදී, අධිපතිවාදී හා ව්‍යාප්තවාදී ආක්‍රමණවලට එරෙහිව එම ජයග්‍රහණය තහවුරුකර නිවැරදිව ඉදිරියට ගෙනයාමට බැරි වුණා. එහෙත් හැත්තෑගණන් වනවිට දේශීය පෙරමුණු සතුරා වැඩි වැඩියෙන් හඳුනා ගැනීමත් සමග තම පෙරමුණු වඩ වඩා පුළුල් කරමින් හා ශක්තිමත් කරමින් ආර්ථික, දේශපාලන හා සංස්කෘතික යන හැම ක්ෂෙත්‍රයකම ඉදිරියට යනු දැක්ම සුබ නිමිත්තකි.

## ප්‍රතිවිරෝධතා

අරගලයක් ජයගැනීමට නම් එහි ඉතිහාස අවදියත් ප්‍රධාන හා අතුරු ප්‍රතිවිරෝධතාත් නිවැරදිව තේරුම්ගෙන වඩා ප්‍රගතිශීලී ඉදිරි අරමුණක් වෙනුවෙන් කැපවිය යුතුව ඇත. අපේ සංස්කෘතික ක්ෂෙත්‍රයේ ප්‍රධානම ප්‍රතිවිරෝධතාව වී ඇත්තේ බැහැරින් එල්ලවී ඇති ආක්‍රමණයයි. එය මූලිකව හා අවසාන වශයෙන් සේවය කරන්නේ ආක්‍රමණිකයාට නිසා මුළු රටටම එකසේ හානිකරය. මේ අනුව මව්බිමේ සියළුම ජන කොටස් මෙම පීඩාකාරී පොදු සතුරු ආක්‍රමණවලට විරුද්ධව අරගල කිරීම සඳහා එක පෙරමුණකට සංවිධානය කළ හැකිය. නූතන ලෝකය ලබා ඇති විද්‍යාත්මක දැනුම, අලුත් දෘෂ්ටීන්, තාක්ෂණය, නව නිෂ්පාදනක්‍රම, කලාත්මක රසඥතා වැනි මානව සංහතියටම පොදු ප්‍රගතිශීලී ජයග්‍රහණ කිසිවක් ප්‍රතික්ෂෙප කරන බවක් මෙයින් අදහස් නොකෙරේ. ඒ තුළින් ආක්‍රමණිකයාගේ එල ප්‍රයෝජනය සඳහා කෙරෙන අනිසි බලපෑමට හා සූරාකෑමට විරුද්ධව පමණි, අප අවදියෙන් සිට කටයුතු කළයුත්තේ.

අනෙක් ප්‍රතිවිරෝධතාව වැඩවසම්වාදය හා නවීනත්වය අතර ප්‍රතිවිරෝධතාවයි. මෙය බැහැරින් එල්ලවන ආක්‍රමණය තරමටම විනාශකාරී නොවුවද අපේ ඉදිරි ගමනට දැනුවත්ව හා නොදැනුවත්ව අකුල් හෙළන්නකි. අරගල තුළින් ලැබූ අපේ අත්දැකීම්වලින්ම මෙය ඔප්පු වී ඇත. කුමාරතුංග ප්‍රමුඛ හෙළහවුල භාෂා හා සාහිත්‍ය අංශයේ අනුගමනය කළ ක්‍රියාමාර්ගය අධිරාජ්‍යවාදී සංස්කෘතික ආක්‍රමණයට එරෙහිව ගෙනගිය අරගලයකි. එය පැහැදිලිවම දේශප්‍රේමී ව්‍යාපාරයකි. එහෙත් ඊට සම්බන්ධ ඇතැම් කොටස් නූතන හා අනාගත තත්වයන් හා අවශ්‍යතාවන් නියෝජනය නොකරමින් ප්‍රමාණයට වඩා වැඩවසම් අතීතයට බරවූ නිසා එයට එතරම් ඉදිරියට යා නොහැකි විය. මේ ප්‍රතිවිරෝධතාවය නිවැරදිව තේරුම් ගත්තා නම් හෙළහවුලට වඩාත් ප්‍රගතිශීලී කාර්යභාරයක් ඉටුකරන්නට ඉඩ තුබුණි. 'සිංහල ලකුණ' සොයාගිය මාර්ටින් වික්‍රමසිංහ වැඩවසම් ප්‍රතිවිරෝධතා සෑහෙන දුරකට ජය ගත්තේය.

මෙහි අනෙක් අන්තයට යාමද, එනම් සම්ප්‍රදාය නොතකා නවීකරණය කිරීමද අතිශයින් හානිකරය. වැඩවසම් සම්ප්‍රදායන් අත්දැකීම් හා හර නිවැරදිව තේරුම් නොගෙන මුළුමනින්ම නවීනවීමට තැත්කිරීමේ විකෘතියට හොඳම නිදසුනකි වී ගොවිතැන. අපේ සම්ප්‍රදායික තාක්ෂණය, අතිරික්ත ශ්‍රමය, මී හරකා, පැරණි ස්වාභාවික පොහොර ආදී සාධක මුළුමනින්ම ප්‍රතික්ෂෙප කර, ට්‍රැක්ටරය හා රසායනික පොහොරවලට වහල්වීමෙන් සිදුවී ඇත්තේ අපේ දියුණුවද නැත්නම් අධිරාජ්‍යවාදීන්ගේ දියුණුවද? මේ ප්‍රශ්නය ජයගත හැක්කේ වැඩවසම් නගුලට හෝ අධිරාජ්‍යවාදී ට්‍රැක්ටරයට හෝ වහල්වීමෙන් නොවේ. අපේ සම්පත් හා අවශ්‍යතා අනුව අලුත් විද්‍යාත්මක දැනුමද ඓතිහාසික අත්දැකීම්ද අවධියට අදාල පරිදි සංයෝගකර නූතන තාක්ෂණයක් ගොඩනැගීමෙනි. ආර්ථික, දේශපාලන හා සංස්කෘතික වැනි හැම අංශයකම ප්‍රගතියක් ලබාගත හැක්කේ මේ අයුරෙනි.

## බාහිර හා අභ්‍යන්තර බලපෑම්

යටත්විජිත ආක්‍රමණය එල්ලවන තුරුම මේ රටේ තීරණාත්මක වූයේ දේශීය සාධකය නොහොත් අභ්‍යන්තර බලපෑමයි. එහෙයින් අවුරුදු 2000 ගණනක ඉතිහාසය තුළ ආර්ථික, දේශපාලන හා සංස්කෘතික වැනි හැම අංශයකම ආධිපත්‍යය ඉසුලුවේ දේශීය සාධකයයි. භාරතීය සංස්කෘතික බලවේගවලට හා දකුණු ඉන්දියානු ආක්‍රමණවලට යටනොවී එහි හර තෝරා බේරාගෙන ජයග්‍රාහී අයුරින් අපේ අවශ්‍යතාවලට උචිත පරිදි යොදගත හැකිවූයේ අධිපති බලය අප අතේ තිබූ හෙයිනි. මෙම අභ්‍යන්තර සාධකයේ නිර්මාණාත්මක

**'හැම සංස්කෘතික අංශයක්ම ඉදිරියට ගෙනයා හැක්කේ අභ්‍යන්තර සාධකය පෝෂණය කිරීමට බාහිර සාධකය උපයෝගී කරගැනීමෙන් මිස, බාහිර සාධකයේ ආධිපත්‍යයට අභ්‍යන්තර සාධකය ගොදුරු කිරීමෙන් නොවන බව පැහැදිලිය.''**

විශිෂ්ඨත්වය වූයේ විදේශීය අදහස්, උදහස් බලවේග ආදිය අපේ පාලනය යටතේ, අපේ අවශ්‍යතාවලට සේවය කරනු සඳහා යොදගැනීමට තිබූ ශක්තියයි.

යටත්විජිතවාදී ආක්‍රමණයත් සමග මේ අභ්‍යන්තර සාධකය යටපත් කරමින්, තීරණාත්මක බවට පත්වූ ඔවුන්ගේ බාහිර සාධකයේ ආධිපත්‍ය යටතේ අපේ සංස්කෘතියද කෙළින්ම ආක්‍රමණයට ගොදුරු වූණා. ඒ මගින් අභ්‍යන්තර සාධකයේ අනන්‍යතාවය හා නිර්මාණාත්මක බව හානිකර ලෙස විනාශ කළා. එතැන් සිට අධිපති බවට පත්වූ බාහිර සාධකය වෙනුවෙන් සේවය කිරීමට දේශීය සාධකයට බල කෙරුණා. ජේරාදෙනි සාහිත්‍ය ගුරුකුලය මීට හොඳ නිදසුනක්. බාහිර සාධකයට ප්‍රමාණය ඉක්මවා ගැතිවීම නිසා ඔවුන් ඇතැම්විට අවංකවම අභ්‍යන්තර සාධකය නොසලකා හරිමින් ඇතිකළ විකෘතිය හා විනාශය සාහිත්‍ය, කලා හා විචාර ක්ෂේත්‍ර තුළ මේ දක්වාත් බලපානවා. ඔවුන් නව විලාසිතාවලට හා විඥානවාදයට වහල්ව නිර්මාණය කළ නිසඳැස් කවියත්, ලිංගික ප්‍රශ්න හුවා දැක්වූ නවකතාත් ඒ පිළිබඳ නිශ්චිත උදහරණ ලෙස දැක්විය හැක.

එහෙත් අභ්‍යන්තර සාධකය මත දැඩිව පිහිටා කළ අරගලයේ ප්‍රතිඵලයක් ලෙස එම නිසඳැස් ආකෘතියම අභ්‍යන්තර සාධකය පෝෂණය කරනු සඳහා යොදගැනීමට අපේ දේශප්‍රේමී කවීන් සමත්ව සිටීම ප්‍රතිවිරෝධතා නිවැරදිව විසඳාගැනීමකි. පරාක්‍රම කොඩිතුවක්කු, මොනිකා රුවන්පතිරණ, ධර්මසිරි රාජපක්ෂ, දෙනගම සිරිවර්ධන, බර්ටි බී. කුඩාහෙට්ටි, මහගම සේකර වැනි කවීන් නිසඳැස් ආකෘතිය තුළින්ම බොහෝදුරට සාර්ථක අත්හදබැලීම් කර ඇත. නවකතාවද ලිංගික හා කල්පිත රාමුවෙන් මිදී ජනතාවගේ හැබෑ ප්‍රශ්න හා අරගල දෙසට යොමුවෙමින් පවතී. නාට්‍යය, සිනමාව, සංගීතය ආදී හැම ක්ෂේත්‍රයකම බාහිර සාධකය පරදවා අභ්‍යන්තර සාධකය මතුකරලීමට කැපවී සිටින දේශප්‍රේමී සංස්කෘතික සේවකයන්ට අපේ ආචාරය පිරිනැමේ. මේ අයුරින් සරච්චන්ද්‍රගේ 'මනමේ' නාට්‍යයෙන් මතුවූ දේශීය සාධකය අද වේදිකාවේ ගැඹුරු වෙමින් හා පුළුල් වෙමින් ගුණාත්මකව වැඩෙනු පෙනේ. ලෙස්ටර් ජේම්ස් පීරිස් 'රේඛාව' තුළින් මතුකළ මේ ගුණය සිනමාව තුළද ජයග්‍රාහීව අරගල කරයි; වික්‍රමසිංහගේ ගම්පෙරළියෙන් ඇරඹුණ යථාර්ථවාදී නව රැල්ල නවකතා ක්ෂේත්‍රයේ ජයග්‍රාහීව ඉදිරියට යයි. මේ අනුව හැම සංස්කෘතික අංශයක්ම ඉදිරියට ගෙනයා හැක්කේ අභ්‍යන්තර සාධකය පෝෂණය කිරීමට බාහිර සාධකය උපයෝගීකර ගැන්මෙන් මිස, බාහිර සාධකයේ ආධිපත්‍යයට අභ්‍යන්තර සාධකය ගොදුරුකිරීමෙන් නොවන බව පැහැදිලිවෙයි.

## බහු ජාතික ස්වරූපය

අපේ අරගලය ඉදිරියට ගෙනයාමට නම් අද පවතින සමාජ යථාර්ථය හා එහි ස්වරූපයද නිවැරදිව තේරුම්ගත යුතුව ඇත. ශ්‍රී ලංකාව බහු ජාතික, බහු ආගමික රටකි. එහි පුරවැසියන් සියලු දෙනාටම මව්බිම එකසේ අයත්ය. අප මෙතෙක් සාකච්ඡා කළ සංස්කෘතික ආක්‍රමණය හා වැඩවසම් පීඩනයද මූලික වශයෙන් මෙහි වෙසෙන හැම ජන කොටසකටම පොදුය. එහෙත් මේ වනතුරු විශේෂයෙන්ම සංස්කෘතික පෙරමුණේ ප්‍රගතිශීලී අරගල කෙරුණේ වෙන් වෙන්වය. ප්‍රධාන සතුරා අමතකකර, මිතුරන් පවා සතුරු ආකාරයෙන් තක්සේරු කරන තරමට මේ බෙදීම දුරදිග ගිය අවස්ථාද ඇත. එයද ආක්‍රමණයේම එක් ප්‍රතිඵලයකි. වෙනත් වචන වලින් කියතොත් සතුරා විසින් මිතුරන් භේදකර ඔවුන් අතර අනවශ්‍ය ගැටුම් මතුකිරීම තුළින් තම පැවැත්ම සහතික කිරීමකි.

සංස්කෘතික අංශයේද හැබෑ ප්‍රගතිශීලී ජයග්‍රහණයක් ලබාගත හැක්කේ සිංහල, දෙමළ හා මුස්ලිම් වැනි සෑම ජන කොටසක්ම එක පෙරමුණකට රොක්වී සාමූහිකව අරගල කිරීමෙන් පමණය. 1976 ජතික නාට්‍ය උත්සවය මෙම සමගිය පිළිබඳ එක් නිදසුනකි. එතෙක් සිංහල හා දෙමළ වශයෙන් වෙන් වෙන්ව පැවැත්වූ නාට්‍ය උත්සව දෙකක්, එකම ජාතික නාට්‍ය උත්සවයක් සේ සංවිධානය කිරීමෙන් ලැබූ ආශ්වාදය හා ඒ තුළින් ගොඩනැගුණු පුළුල් මිත්‍රත්වය කොතරම් උණුසුම් හා ගැඹුරු එකක් විදූයි අපට දැකගත හැකිවිය.

යටත් විජිතවාදීන්, මෙරට පා තැබූද සිට අද දක්වා විවිධ මං හා විවිධ දේශප්‍රේමීන් ඔස්සේ කෙරීගෙන එන සංස්කෘතික අරගලයේ සියළුම ධනාත්මක මෙන්ම ඍණාත්මක අත්දැකීම් වලින් නිසි පාඩම් ඉගෙනගෙන, අපේම අවශ්‍යතා, හැකියාවන් හා ස්වශක්තිය මත දැඩිව දෙපා රඳවාගෙන, ප්‍රගතිශීලී විදේශීය සංස්කෘතීන්ගෙන් නිසි ආහාෂය උරාගනිමින්, සැබෑ අධිරාජ්‍ය විරෝධී – වැඩවසම් විරෝධී සිංහල, දෙමළ, මුස්ලිම් වැනි සියලුම බලමුළු එක් රොක්වූ සංස්කෘතික පෙරමුණක් ගොඩ නගමු. කම්කරු පන්තියේ නායකත්වය හා ගොවි-කම්කරු සංවිධානය වටා ගොනුවූ එක්සත් පෙරමුණ හා අත්වැල් බැඳගෙන අධිරාජ්‍යවාදය, නව යටත්විජිතවාදය, සමාජ අධිරාජ්‍යවාදය හා ඉන්දියානු ව්‍යාප්තවාදය ඔස්සේ ගලාවිත් ජාතියේ දේහය තුළ ලේ පිළිකාවක් මෙන් ඔඩු දුවමින් ඇති සංස්කෘතික ආක්‍රමණයන් පරදා, ඒ සුන්බුන් මත ස්වරූපයෙන් ජාතිකවූත්, හරයෙන් විද්‍යාත්මකවූත් නව සංස්කෘතියක් ගොඩ නගමු ●

**සංස්කාරකවරු**

---

**මාවත සහරාවේ දායකයකුවීම:–**

- **නොකඩවා පිළිවෙලින් මාවත ලබාගැනීමේ නොවරදින මඟකි.**
- **මාවතහි පැවැත්ම හා වර්ධනය සහතික කිරීමකි.**
- **ප්‍රගතිශීලී ලාංකික සාහිත්‍යයක්, කලාවක් හා සංස්කෘතියක් ගොඩනැඟීමේ වෑයමට අතදීමකි.**

මාවත කලාප 6 ක දායක මුදල (තැපැල් ගාස්තුවත් ඇතුළුව) රු: 9.00කි. (දායකයන් 10 දෙනෙකු බඳවා දෙන කෙනෙකුට නොමිලේ දායකත්වයක් පිරිනැමේ.)

චෙක්පත්, මුදල්/තැපැල් ඇණවුම් සුසිල් සිරිවර්දන නමට ලියා එවන්න.

මාවත ප්‍රකාශකයෝ, අසෝක පොත්හල බාරේ.
183, ගාලුපාර, කොළඹ 4.